# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# "Crative Sri Lanka 2030" ව්‍යාපාර සහසම්බන්ධ ගත කිරීමේ (Business Link up) ව්‍යාපෘතිය සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් හා ඒකාබද්ධව 2026 වසරේ දී "Crative Sri Lanka 2030" ව්‍යාපෘතිය දියත් කිරීමට යෝජනා කරයි. තෝරාගත් ශ්‍රී ලාංකීය සන්නාම දහයක් (10) මෙහෙයුම් සංවිධාන (Umbrella Organizations) ලෙසත්, ඒ හා අනුබද්ධව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (SMEs) 40 - 50 පමණ උපායමාර්ගිකව ස්ථානගත කරමින් ගෝලීය වෙළෙඳ පොළ වෙත සාර්ථකව ප්‍රවේශ කරවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

නිර්මාණාත්මක කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ශීඝ්‍ර වර්ධනය සහ එහි ගෝලීය වැදගත්කම හඳුනා ගනිමින් ජාතික ආර්ථික හා සාමාජීය සංවර්ධනයට බලපෑම් කළ හැකි ප්‍රධාන ක්ෂේත්‍රයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය මෙම අංශය හඳුනාගෙන ඇත. මේ අනුව අපනයන තරඟකාරීත්වය ඉහළ නැංවීම, නවෝත්පාදනය දිරිගැන්වීම සහ නිර්මාණාත්මක විශිෂ්ටත්වය හා තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමේ කලාපීය කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

**අරමුණු:**

1. ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්ත සන්නාම 10 ක් ජාත්‍යන්තරව පිළිගත් සන්නාම ලෙස සංවර්ධනය කිරීම සහ එම ක්ෂේත්‍රයේ දෙවන පෙළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම.
2. සදාචාරාත්මක සහ තිරසාර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ ඉහළ අගය එකතු කළ සුවිශේෂී නිෂ්පාදන (Niche products) අපනයනය වැඩි කිරීම මගින් ආර්ථික සංවර්ධනයට උපරිම දායකත්වයක් ලබා දීම.
3. නිර්මාණාත්මක කර්මාන්ත සඳහා නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.
4. නිර්මාණාත්මක කර්මාන්ත පිළිබඳ වෙළඳ පොළ දැනුවත්භාවය සහ වෙළඳ පොළ ප්‍රවර්ධනය වැඩි දියුණු කිරීම

**කවුරුන් සඳහා ද**

අත්කම් නිර්මාණ, තෑගි භාණ්ඩ, විසිතුරු භාණ්ඩ (Handicrafts, Giftware and Lifestyle) ආදී ක්ෂේත්‍රවල නියැළී සිටින අපනයනකරුවන්, විභව අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් / ව්‍යවසායකයින් හට පහත සඳහන් කාණ්ඩ දෙක යටතේ අයදුම් කළ හැකිය.

1. නිර්මාණ සහ නිෂ්පාදන සංවර්ධන හැකියාවන් සහිත, සමාජ වගකීම් සඳහා කැපවී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති තිරසාර සහ සදාචාරාත්මක නිෂ්පාදකයින්.
2. නිර්මාණ සංවර්ධනය සහ වෙළඳපොළ ප්‍රවේශය සඳහා ප්‍රධාන සන්නාම සංවිධාන (Umbrella organizations) සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs).

**අයදුම් කරන ආකාරය**

අයදුම්පත්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 6 වන මහලේ පිහිටි කාර්මික නිෂ්පාදන අංශයෙන් ලබා ගත හැකි අතර, www.srilankabusiness.com වෙබ් අඩවියේ "Announcements " වෙතින් ද බාගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, කවරයේ ඉහළ වම් කෙළවරේ "Creative Sri Lanka 2030" ලෙස සඳහන් කර, අධ්‍යක්ෂ, කාර්මික නිෂ්පාදන අංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යන ලිපිනයට 2026 අප්‍රේල් 28 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ව්‍යාපෘතිය සඳහා සහභාගිවන්නන් තෝරා ගැනීම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කරනු ලැබේ.

වැඩිදුර තොරතුරු සඳහා මංගලා මධුවන්ති මිය (සංවර්ධන නිලධාරී) : 077 227 8196 / mangala@edb.gov.lk හෝ ෂර්මිලා හේරත් මිය (අපනයන ප්‍රවර්ධන නිලධාරී), 078 674 8117/ shermi@edb.gov.lk, කාර්මික නිෂ්පාදන අංශය – 011 2300710 (Ext. 357 හෝ 354) සම්බන්ධ කර ගන්න.

**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB – EDB කුලුන, නො. 42, නවම් මාවත, කොළඹ 02.**
**දුරකථන : 011-2300705 - 11 / ෆැක්ස් : 011-2300715**
**විද්‍යුත් තැපෑල : edb@edb.gov.lk**
**වෙබ් අඩවිය: www.srilankabusiness.com**